# ලංසු කැඳවීම

## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

## විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලාව කිළිටි රෙදි සෝදා පිරිසිදු කිරීම 2026/2027

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලාවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සභාපති විසින් 2026/2027 වර්ෂය සඳහා කිළිටි රෙදි සේදීමේ සේවාව අඛණ්ඩව පවත්වා ගෙන යාම සිදුකළ හැකි කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ.

01. මේ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශවයන් සඳහා විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ **සරප් අංශය** වෙත ආපසු නොගෙවනු ලබන .රු.3500/- මුදලක් ලංසු ලියවිලි ගාස්තු වශයෙන් ගෙවා ලබාගත් ලදුපත සමඟ ලිඛිත ඉල්ලීමක් හා තම ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් ඉදිරිපත් කිරීමෙන් **2026.09.25** වන දින සිට **2026.10.14** වන දින දක්වා සාමාන්‍ය රාජකාරී දිනවල පෙ.ව.**9.00** සිට ප.ව.**3.00** දක්වා කාලය තුළ විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලාවේ කාර්යාල අංශයෙන් ලංසු ලියවිලි ලබාගත හැක.

| ටෙන්ඩර් අංකය | වත්කම් සහතිකයේ වටිනාකම රු. | ලංසු ඇපකරයේ වටිනාකම රු. | ලංසු ලියවිලි ගාස්තුව රු. |
|---|---|---|---|
| WKMH/MA-07/06/2026 | 500,000/- | 77,100/- | 3500/- |

01. මෙම කොන්ත්‍රාත්තුව සඳහා පහත සඳහන් මූලික සුදුසුකම් සපුරා ලිය යුතුය.

I. රජයේ අනුමත ප්‍රජා සංවිධාන සඳහා අදාල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් නිකුත් කල ලියාපදිංචි සහතිකය.

II. රෙදි සේදීමේ, වියලීමේ සහ මැදීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන බවට ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය හෝ සමාගම් රෙජිස්ටාර් කාර්යාලයේ සමාගමක් ලෙස ලියාපදිංචි කල ලියාපදිංචි සහතිකයෙහි සහතික කල පිටපතක්.

III. විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ සේදිය යුතු රෙදි ධාරිතාවට ප්‍රමාණවත් පරිදි රෙදි වියළීමේ පහසුකම් ඇති බවට තහවුරු කිරීමේ සහතිකයක්.

IV. රෙදි සෝදන ස්ථානය සහ වියලන ස්ථාන අයත් වන ප්‍රදේශය භාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් නිකුත් කරන ලද රෙදි සෝදන සහ වියලන ස්ථාන පිළිබඳ යෝග්‍යතා සහතිකය.

V. පෙර සේවා පළපුරුද්ද පිළිබඳව ආසන්න වර්ෂ 02ක පළපුරුද්ද ඇතුළත් සහතිකය.(මසකට රෙදි කැබලි 500 කට වැඩි ප්‍රමාණයක් සෝදන රජයේ ආයතනයක් , අර්ධ රාජ්‍ය ආයතනයක් හෝ පෞද්ගලික ආයතනයක්/ ආයතන මගින් ලබාගත් පලපුරුද්ද පිලිබද සහතිකයක් / සහතික ඉදිරිපත් කල යුතුය.)

*** අනෙකුත් සුදුසුකම් සියල්ල සපුරන ලද සේවා පළපුරුද්ද පමණක් නොමැති නවක අයදුම්කරුවෙකු මේ සඳහා ඉදිරිපත්වන්නේ නම් ඔහුට හෝ ඇයට 15%ක කාර්යසාධන ඇපකරයක් ලබාගැනීමට යටත්ව මෙම කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා තෝරා ගැනීම සලකා බැලීමේ අභිමතය ප්‍රසම්පාදන මණ්ඩලය සතුය.**

VI. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන වත්කම් සහතිකයේ වටිනාකම රු.500,000 ක් විය යුතු අතර ලංසු ලියවිලි නිකුත් කරන දින සිට මාස 06 කට වලංගු වන පරිදි ඉදිරිපත් කල යුතුය.

VII. මධ්‍යම පරිසර අධිකාරිය මඟින් නිකුත් කරන ලද පරිසර බලපත්‍රය.

VIII. පොදු කොන්ත්‍රාත් පනතේ 8 වැනි වගන්තිය යටතේ වන ලියාපදිංචි සහතිකය.

02. අසම්පූර්ණ අයදුම්පත් හා ඉදිරිපත් කල යුතු ඉහත I - VIII දක්වා සියලු ලේඛනගත සාක්ෂි නිසි පරිදි සහතික කර අයදුම්පත සමඟ අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙන අතර අදාල ලිපි ලේඛන පසුව භාරගනු නොලැබේ.

03.ලංසු ලියවිලි මුල් පිටපත හා අනු පිටපත වශයෙන් සකස් කර කවර දෙකක බහා එම කවර දෙක තනි කවරයක බහා සීල් තබා වම්පස ඉහල කෙලවරෙහි " විජය කුමාරතුංග අනුස්මරණ රෝහල **සඳහා 2026/10/15** දින **පෙ.ව.10.00ට විවෘත කිරීමට නියමිත 2026/2027 වර්ෂය සඳහා කිළිටි රෙදි සේදීමේ ප්‍රසම්පාදනය"** යනුවෙන් සඳහන් කල යුතුය.

03. සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි **2026.10.15** දින පෙ.ව **10.00** හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විජය කුමාරතුංග අනුස්මරණ රෝහල කොළඹ පාර ,සීදූව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ එම ලිපිනයේ පිහිටි කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කල හැකිය.

04. **2026.10.15** දින **පෙ.ව. 10.00** ට ලංසු භාරගැනීම අවසන් වූ විගස එම ස්ථානයේදීම ලංසු අයදුම්පත් විවෘත කරන අතර, ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගිවීමට අවසර දෙනු ලැබේ.

05. රජයේ කොන්ත්‍රාත් කොන්දේසි කඩකර අසාධු ලේඛණ ගත කොට ඇති පුද්ගලයින්ට මෙම ප්‍රසම්පාදනය සඳහා ඉදිරිපත් විය නොහැක.

06. ඉදිරිපත් කරනු ලබන ලංසු සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතුය.

02. ලංසු ලියවිලි මුදල් ගෙවීමකින් තොරව විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ කාර්යාලයේදී සාමාන්‍ය රාජකාරි වේලාව තුළ දී පරික්ෂා කිරීමට හැකිය. වැඩිදුර තොරතුරු විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ කාර්යාලයේ ගණකාධිකාරි හෝ පරිපාලන නිලධාරි වෙතින් දුරකථන අංක 011 – 2258862-4 මඟින් විමසිය හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලාව
කොළඹ පාර,
සීදූව